කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 අප්‍රේල්/මැයි/ජූනි

සමාජීය විද්‍යා පීඨය

සංවර්ධන අධ්‍යයනය - DVST - E 3015

# සංවර්ධන න්‍යාය සහ භාවිතය

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සහශ්‍ර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා දකුණු ආසියානු රටවල් අතර ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සන්සන්දනාත්මකව අගයන්න.

02. ලෝකයේ ක්‍රියාත්මක වන 'බලය හා ධනය' පිළිබඳ අරගලය හමුවේ දිළිඳු රටවල් මුහුණදෙන ගැටළු පිළිබඳ න්‍යායාත්මක කරුණු පැහැදිලි කරන්න.

03. ජාත්‍යන්තර සංවිධානවල න්‍යායපත්‍රයන්හි 'මානව හිමිකම් සහ සාමය' මූලිකස්ථානයෙහි ලා සැලකීමට හේතු දක්වන්න.

04. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා මහා පරිමාණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන පිටිවහල සාකච්ඡා කරන්න.

05. මතු දැක්වෙන මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

- අ. චීනයේ ආර්ථික වර්ධන ප්‍රවනතා
- ආ. මැදපෙරදිග දේශපාලන ප්‍රවනතා
- ඇ. ලෝකයේ සරණාගතයින් පිළිබඳ ප්‍රශ්නය
- ඈ. බහුජාතික සමාගම්

06. දියුණුවන රටවල සංවර්ධනය සඳහා විදේශ ආධාර මත තවදුරටත් යැපීම නිසා පැනනැගී ඇති ගැටළු නිදසුන් සහිතව දක්වන්න.

07. ශ්‍රී ලංකාවේ දිගුකාලීන සංවර්ධන සැලසුම්කරණයේ දී සළකා බැලිය යුතු සාධනීය සහ නිශේධනීය සාධක තුලනාත්මකව විමසන්න.

08. කලාපීය වෙළෙඳ හවුල් පිහිටුවා ගැනීම තුලින් රටවල් අත්කරගනු ලබන වාසි විවේචනාත්මකව අගයන්න.

**************************